**රත්මලාන / මොරටුව සහ ජා-ඇළ / ඒකළ අපජල අපහරණ ව්‍යාපෘතිය - 2014**

----------------------------------------------------------------------------------

රත්මලාන / මොරටුව සහ ජා-ඇළ / ඒකළ අපජල අපහරණ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ස්විඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය අතර එළඹී 2006 මාර්තු 02 දිනැති නිශ්චිත ගිවිසුමේ (දායකත්ව අංක 71001436) II ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------

ව්‍යාපෘතියේ නිශ්චිත ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පරිසරයට හෝ ජනතාවට අහිතකර නොවන ආකාරයෙන් කාර්මික හා ගෘහස්ත අපජලය පිරිපහදුව මධ්‍යම පිරිපහදු යන්ත්‍රයෙන් විධිමත්ව එකතුකර ගැනීම සමඟ පිරිපහදු අපජලය හා බොර අපහරණය මඟින් රත්මලාන / මොරටුව සහ ජා-ඇළ / ඒකළ ප්‍රදේශ දෙකෙහි දූෂණ කළමනාකරණය සහතික වීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. සංවේදී හරිත පද්ධතියේ පාරිසරික තත්ත්වය වැඩි දියුණු කළ ප්‍රදේශ වල ජනයාගේ සෞඛ්‍ය හා ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහ රත්මලාන / මොරටුව සහ ජා-ඇළ / ඒකළ ප්‍රදේශ වල මළ පද්ධතිය හා පිරිපහදු පහසුකම් ප්‍රතිපාදන මඟින් කොළඹ ආශ්‍රිත ප්‍රදේශ වල තිරසාර කාර්මික සංවර්ධනයක් ස්ථාපිත කිරීමට දායක වීම ව්‍යාපෘතියේ දිර්ඝ කාලීන සමස්ත අරමුණු වේ. විශේෂිත ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 12,135 කට සමාන එජඩො මිලියන 120.02 ක් වූ අතර ඉන් රු. මිලියන 9,058 කට සමාන එජඩො මිලියන 91.92 ක් හෙවත් සියයට 74.6 ක් ණය ලෙස සහ රු. මිලියන 474 කට සමාන එජඩො මිලියන 4.14 ක් හෙවත් සියයට 3.9 ක් ප්‍රදානයක් ලෙස මූල්‍යායනය කිරීමට ස්විඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී ඇත. ඉතිරි ශේෂය වන රු. මිලියන 2,603 කට සමාන එජඩො මිලියන 23.96 ක් හෙවත් සියයට 21.5 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත. පසුව, රු.මිලියන 17,471 කට සමාන එජඩො මිලියන 148.91 ක් දක්වා ව්‍යාපෘතියේ මුළු පිරිවැය සංශෝධනය කළ අතර ඉන් රු. මිලියන 11,315 කට සමාන එජඩො මිලියන 95.06 ක් හෙවත් සියයට 64.08 ක් ණයක් ලෙස සහ රු. මිලියන 1,034 කට සමාන එජඩො මිලියන 8.99 ක් හෙවත් සියයට 5.9 ක් ප්‍රදානයක් ලෙස මූල්‍යායනය කිරීමට ස්විඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී ඇත. ඉතිරි ශේෂය වන රු. මිලියන 5,122 කට සමාන එජඩො මිලියන 44.86 ක් හෙවත් සියයට 29.3 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 පෙබරවාරි 01 දින ආරම්භ කළ අතර 2013 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිත විය. පසුව, ව්‍යාපෘති කාලය 2016 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) නිශ්චිත ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඈ) විශේෂිත ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඊ) විශේෂිත ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 113.38 ක් වටිනා ඉඩම් හා ඉඩම් පරිපාලන පිරිවැය සින්නක්කර ඉඩම් යටතේ දක්වනවා වෙනුවට 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී ඉඩම් හා ඉඩම් පරිපාලන කටයුතු සඳහා වැය කළ රු. මිලියන 3.42 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දක්වනවා වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ආ) රත්මලාන /මොරටුව ප්‍රදේශ වල අපජල නළ මාර්ග එළීම මත මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සිදු කළ වටිනාකම රු. මිලියන 9.20 ක සහතික බැඳුම්කර ගිණුම් වලට ගෙන නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද එකතුව රු.මිලියන 1,424.42 ක එකතු කළ අගය මත බදු කෙරීගෙන යන වැඩ යටතේ දක්වනවා වෙනුවට රජයේ දායකත්ව අරමුදලට එරෙහිව පියවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රජයේ දායකත්වය හා කෙරීගෙන යන වැඩ ඒ හා සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 නොසැසඳු ශේෂ

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය යටතේ දක්වා ඇති රු. මිලියන 438.70 ක් වූ මුළු වියදම, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. මිලියන 659.45 ක් වූ මුළු වියදම සමඟ නොගැලපුණි. රු.මිලියන 220.75 ක වෙනස සැසඳීම් කර නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 12,839.33 ක් විය. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල ඊට අදාළ වටිනාකම රු. මිලියන 12,856.84 ක් ලෙස දක්වා තිබුණි. රු. මිලියන 17.51 ක වෙනස සංසන්දනය කර ගිණුම් වල ගලපා නොතිබුණි.

### 2.2.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඞී/2007/2 අනුව, 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 හෝ එදිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ තිබුණේ 2015 දෙසැම්බර් 15 දිනදීය.

(ආ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් බාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩර් පිරිනැමීමෙන් පසු දින 60 ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹි කොන්ත්‍රාත්කරුවන් විසින් ඉහත සඳහන් අවශ්‍යතාවයන් වලට අනුකූල වී නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 ප්‍රකාරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘතියේ ගණුදෙනු විගණනයට භාජනය කර නොතිබුණි.

(ඈ) රු. මිලියන 142.84 ක් වටිනා ව්‍යාපෘතියේ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

---------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිලිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය / ප්‍රදාන ගිවිසුමේ මූල්‍යායනය කිරීමට එකඟ වූ මුදල | | | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වෙන්කිරීම | | සංශෝධිත වෙන්කිරීම | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ණය | 91.92 | 9,058 | 95.06 | 11,315 | 400.00 | 1.14 | 148.75 | 85.69 | 9,834.88 |
| ප්‍රදාන | 4.14 | 474 | 8.99 | 1,034 | 100.00 | 1.69 | 220.75 | 8.00 | 960.81 |
| ශ්‍රී ලං ර | 23.96 | 2,603 | 44.86 | 5,122 | 306.13 | 2.22 | 289.95 | 27.44 | 3,573.85 |
| | 120.02 | 12,135 | 148.91 | 17,471 | 806.13 | 5.05 | 659.45 | 121.13 | 14,369.54 |

### 3.2 භෞතික ප්‍රගතිය

--------------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් සියයට 91 හා සියයට 82.85 ක් ලෙස පැවතිණි. ජා-ඇළ / ඒකළ අපජලය පිරිපහදුවේ ඉදිකිරීම් වැඩ හා නළ එළීමේ කටයුතු 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රමාණවත් පරිදි නිම කර තිබුණි. මොරටුව / රත්මලාන අපජලය පිරිපහදුවේ ඉදිකිරීම් වැඩ හා නළ එළීමේ කටයුතු 2014 දෙසැම්බර් 31 දිනට සියයට 91.16 ක ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණද, ආරෝහක නළ එළීම, කාණු කවාට ඉදිකිරීම හා

පීඩන පරීක්ෂා කිරීම් ආදී අනෙකුත් අතුරු කටයුතු 2014 වර්ෂය තුළදී සියයට 0.38 ක අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 දී පිරිනමන ලද රත්මලාන / මොරටුව අපජලය අපහරණ පද්ධතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරු බුන්වත්වීම මත කොන්ත්‍රාත් කටයුතු අඛන්ඩව සිදු කිරීමට අපොහොසත් වීම නිසා ව්‍යාපෘතිය විසින් 2013 දී අත්හිටුවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ කාර්ය සාධන බැඳුම්කරය හා රඳවාගැනීමේ මුදල් මත ඇපකරය වෙනුවෙන් තහවුරු කිරීම් ලබා ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එජඩො මිලියන 9.06 ක කාර්ය සාධන බැඳුම්කරය හා රඳවා ගැනීම් මුදල් මත සිදු කළ එජඩො මිලියන 7.96 ක ඇපකරය විදේශීය වානිජ බැංකුවකින් මුදල් කර ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ ජාත්‍යන්තර ආයතනයකින් නිති උපදෙස් ලබා ගැනීමට, අමතරව රු. මිලියන 3.55 ක් වැයකර තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුට විරුද්ධව නීතිමය කටයුතු කිරීමට 2016 අප්‍රේල් 30 දක්වා ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.

(ii) ඉහත කරුණුවලට අමතරව කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවූ එජඩො මිලියන 6.74 නැවත අය කර ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා ටෙලිකොම් හා ලංකා විදුලිබල මණ්ඩලය විසින් තම ආයතන වල දේපල වලට සිදු වූ අලාභ මත රු. මිලියන 17.81 ක හිමිකම් අයදුම් කර තිබුණි.

(iii) කොන්ත්‍රාත් වැඩ නිම කිරීමේ ප්‍රමාදයන් මත දුෂ්කරතා වලට මුහුණ දුන් නිවැසියන් හා මාර්ග භාවිතාකරන්නන් විසින් සිදු කළ පැමිණිලි මත මාර්ග පාදමේ තත්ත්වය පිළිසකර කිරීමට රු. මිලියන 23. 75 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ජා-ඇළ/ ඒකළ අපජලය අපහරණ කළමනාකරණ පද්ධතියේ කොන්ත්‍රාත් වැඩ 2012 දී නිම කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත බාර දී තිබුණද එජඩො 33,000 ක ඇස්තමේන්තු පිරිවැයකට කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ යුතු වාමුසු ධාරිතා පරීක්ෂණය 2016 අප්‍රේල් 30 දින වන විටත් සිදු කර නොතිබුණි.

**3.4 මතභේදයට තුඩු දෙන කරුණු**

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිචයක් ලෙස, ව්‍යාපෘති සේවක පාරිශ්‍රමිකය ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතර ව්‍යාපෘතිය එහි පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන ගියද එසේ ගණනය කළ වැටුපෙන් සියයට 20 ක් පොදුකාර්යය වියදම් ලෙස ව්‍යාපෘතියෙන් අය කරනු ලැබේ.ව්‍යාපෘතිය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන

මණ්ඩලය වෙත 2014 දෙසැම්බර් 31 දිනට එසේ ගෙවන ලද පොදුකාර්ය වියදම් වටිනාකම රු. මිලියන 253.27 ක් විය.

(ආ) මොරටුව / රත්මලාන අපජලය පිරිපහදු හා අපහරණ පද්ධතියේ ඉදිකිරීම වැඩ අවසන් කර නොතිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ රජයේ දායකත්ව මුදලෙන් රු.මිලියන 1.82 ක් සමාරම්භක උත්සවයක් සඳහා ව්‍යාපෘතිය වැය කර තිබුණි.

## 3.5 අදාළ නොවූ ගණුදෙනු

------------------------

මාදිවෙල ලින්ක් නිවාස යෝජනා ක්‍රමය සඳහා අපජලය පිරිපහදු හා අපහරණ පද්ධතිය ඉදිකිරීම් වැඩ සඳහා සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයින් සඳහා සොයිසාපුර නිල නිවාස ඉදිකිරීම හා නිම කිරීම වෙනුවෙන් සැලැසුම් හා ගොඩනැගිලි කොන්ත්‍රාත් ඉදිකිරීම් වැඩ සඳහා ව්‍යාපෘතිය විසින් වැය කළ රු. මිලියන 37.44 ක් ව්‍යාපෘති අරමුණු වලට ඍජුව සම්බන්ධ නොවුණි.

## 3.6 පෙර විගණන මගින් පෙන්වා දුන් නොවිසඳුණු විගණන නිරීක්ෂණ

-------------------------------------------------------------------

පෙර විගණන වාර්තා වල පෙන්වා දුන් නොවිසඳී ඇති කරුණු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) 2012 දී රු. මිලියන 28.23 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන හතක් අනුචිත ලෙස කෙරීගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) විශේෂිත ගිවිසුමේ I ව්‍යවස්ථාව අනුව, ජා-ඇළ/ ඒකල අපජලය පිරිපහදු පාලන යන්ත්‍ර මගින් පරිසරයට හෝ ජනතාවට හානි නොවන ආකාරයෙන් පිරිපහදු ජලය හා බොර අපහරණය කළ යුතුය. කෙසේ වෙතත් 2016 විගණන දිනය වන විටත් එවැනි පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.7 මූල්‍ය පාලනයේ අඩුපාඩු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දැනටමත් වැඩ නිම කර අදාළ පාර්ශවයන් වෙත බාර දී තිබුණද, මාර්ග පුනස්ථාපන වැඩ සඳහා 2009, 2010 සහ 2011 වර්ෂ වලදී ලබා ගත් එකතුව රු. මිලියන 20.82 ක බැංකු ඇපකර 10 ක වටිනාකම 2016 අප්‍රේල් 30 දින වන විටත් මුදා හැර නොතිබුණි.

(ආ) ආපසු ගෙවිය යුතු තැන්පත් කාලය ඉකුත් වී තිබුණද, මාර්ග කලින් තිබූ තත්වයට පත් කිරීමේ වැඩ සඳහා 2012 දී හා 2013 දී මාර්ග සංවර්ධන අධිකාරියේ තැන්පත් කළ එකතුව රු.මිලියන 12.98 ක ආපසු ගෙවිය යුතු තැන්පත් 05 ක් මුදල් කර ගෙන නොතිබුණි.